හබරාදූව ප්‍රාදේශීය සභාව
ගාල්ල දිස්ත්‍රික්කය

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 අප්‍රේල් 06 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 17 දින ද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජුනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට හබරාදූව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මිලදී ගත් රු.102,510 ක් වූ ලී බඩු හා උපකරණ හා රු.399,960 ක් වූ ක්‍රීඩා උපකරණ ගිණුම්ගත කර නොතිබුණි. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.5,019,194 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ණයහිමි ප්‍රතිපාදනයන් ඇතිකර ගත යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | අහංගම පැරණි වෙළඳ සංකීර්ණයෙන් ලැබිය යුතු එක්වන් මුදල් රු.74,000 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. | ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලී බඩු හා සවිකිරීම් හා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වටිනාකම තුල රු.81,270 ක් වූ පාරිභෝජන ද්‍රව්‍ය අයිතම 09 ක් ඇතුළත් කර තිබුණි. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.3.2 නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 04 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.3,806,981 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | පවතින අසමාන -තාවයන් ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.3.3 අවිනිශ්චිත ගිණුම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2008 වර්ෂයේ සිට ඉදිරියට ගෙනෙමින් පවතින රු.601,430 ක් වූ අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය හඳුනාගෙන ගිණුම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අවිනිශ්චිත ගිණුමට බලපෑ හේතු හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) ලැබිය යුතු ගිණුම්** | | |
| වසර ගණනාවක සිට මූල්‍ය ප්‍රකාශනවල නොවෙනස්ව ඉදිරියට ගෙනෙන ලද එකතුව රු.1,329,705 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 05 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ගිණුම් ශේෂ අයකර ගත යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ)** **ගෙවිය යුතු ගිණුම්**

| | | |
|---|---|---|
| 2011 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල නොවෙනස්ව ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.8,862,715 ක් වූ ගෙවිය යුතු ගිණුම් 05 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කළ යුතුවේ. | ඉදිරියේ දී නිරවුල් කිරීමට කටයුතු කරමි. |

**1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

**තොරතුරු ඉදිරිපත් නොකිරීම**

| **විස්තරය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| රු.155,092,290 ක් වූ ගිණුම් විෂයයන් 11 ක් සඳහා වූ අවශ්‍ය තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතු අතර කාල විශේෂණ පිළියෙල කල යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.4 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව** | **අනුකූල නොවීම** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| **(අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති** | | | |
| (i) රීති 33 | වරිපනම් බදු ගෙවීම් පැහැර හැර ඇති පුද්ගලයින් පිළිබඳ ලැයිස්තු සහ දේපල තහනම් කිරීමේ ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී වරෙන්තු නිකුත් කර, හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ii) රීති 145 | ආපසු ගෙවිය යුතු තැන්පත් පිළිබඳ විස්තරාත්මක ප්‍රකාශයන් සකස් කර ලෙජරයේ දැක්වෙන ශේෂය සමඟ ගැලපීම් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී රීති ප්‍රකාරව කටයුතු කර නිවැරදි කරමි. |
| (iii) රීති 193 | අයවැය සමඟ වැය විෂයයන් සසඳා අතිරික්ත හා ඌණතාවලට හේතු දැක්වෙන ප්‍රකාශනයන් පිළියෙල කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී රීති ප්‍රකාරව කටයුතු කර නිවැරදි කරමි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | | |
| (i) මුදල් රෙගුලාසි 371 | නිලධාරීන්ට 2019 වර්ෂයේ දී ගෙවූ රු.161,159 ක් වූ අත්තිකාරම් හා පෙර වර්ෂයන්හි ගෙවූ රු.446,108 ක් වූ අත්තිකාරම් පියවා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරමි. |
| (ii) මුදල් රෙගුලාසි 396(ඇ) | * පොදු ගිණුමෙන් නිකුත් කරන ලද නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකල වලංගු කාලය ඉක්මවා තිබූ රු.413,109 ක් වටිනාකම වු චෙක්පත් 15 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරමි. |
| | * කර්මාන්ත ගිණුමට අදාලව 2017 වර්ෂයේ තැන්පත් කළ උපලබ්ධි නොවු චෙක්පත් රු.96,265 ක් නිරවුල් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරමි. |
| (iii) මුදල් රෙගුලාසි 571(1)(2) | වසර 02 ක කාලයක් ඉක්මවා තිබුණ එකතුව රු.1,018,550 ක තැන්පත් ශේෂ 74 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| | (iv) මුදල් රෙගුලාසි 1645 හා 1646 | සභාව සතු වාහන 03 ක දෛනික ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| **(ඇ)** | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** **------------------------** | | | |
| | (i) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3.1 වගන්තිය | සභාව සතු වාහන නවයක ඉන්ධන දහන පරීක්ෂාව කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරමි. |
| | (ii) 2015 ජූලි 10 දිනැති අංක 2/2015 දරන භාණ්ඩාගාර ලේකම්ගේ හා මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය | සභාව සතු අබලන් වාහන 08 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරමි. |

## 2 මූල්‍ය සමාලෝචනය

---------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.11,841,892 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.4,416,009 ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **බැංකු සැසඳුම් පිළියෙල කිරීම** | | |
| (i) සාමාන්‍ය ගිණුම | | |
| 2013 වර්ෂයේ මුදල් අයකැමි නමට රු.48,750 ක් වැඩියෙන් ලියූ චෙක්පත, 2014 වර්ෂයේ සිට පවතින රු.13,398 ක් වූ බැංකුවේ අඩුවෙන් තැන්පත් කිරීම,2013 වර්ෂයේ දී වැරදීමකින් පරිසර ගිණුමේ ආදායම රු.72,385 ක් සාමාන්‍ය ගිණුමට බැර කිරීම හා 2015 වර්ෂයේ සිට ගිණුමට බැර වී ඇති හඳුනා නොගත් රු.76,989 ක් වූ ආදායම් නිරවුල් කර නොතිබුණි. | බැංකු සැසඳුම් නිවැරදිව පිළියෙල කිරීමට හා රජයේ මුදල් අවභාවිතය සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීමටත් ක්‍රියා කල යුතුවේ. | ඉදිරියේ දී පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) කර්මාන්ත ගිණුම | | |
| කර්මාන්ත ගිණුමේ ආදායම රු.13,000 ක් වැරදීමකින් පරිසර ගිණුමට බැර වීම හා 2017 වර්ෂයේ තැන්පත් කල උපලබ්ධි නොවූ චෙක්පත් වටිනාකම වූ රු.96,265 ක් නිරවුල් කර නොතිබුණි. | බැංකු සැසඳුම් පිළියෙල කර නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම | 2019 බිල් කළ ආදායම | 2019 රැස් කළ ආදායම | 2019 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල් කළ ආදායම | 2018 රැස් කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 5,377,000 | 4,181,895 | 3,664,093 | 8,579,689 | 4,071,700 | 3,755,197 | 3,097,984 | 8,061,887 |
| කුලී | 12,470,000 | 4,952,865 | 5,678,250 | 564,442 | 26,840,000 | 20,886,239 | 7,935,640 | 1,289,827 |
| බලපත්‍ර ගාස්තු | 6,034,870 | 482,000 | 482,900 | 51,300 | 7,824,850 | 432,850 | 431,650 | 52,200 |
| | 23,881,870 | 9,616,760 | 9,825,243 | 9,195,431 | 38,736,550 | 25,074,286 | 11,465,274 | 9,403,914 |

**2.3.2** උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.4,385,082 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.169,812,512 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ ආදායම් රැස්කර ගනිමින් පවතී. |

**3.** මෙහෙයුම් සමාලෝචනය

**3.1** කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ)** **ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුවේ. | ඉදිරියේ දී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරමි. |

**(ආ)** **ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) සභා බලප්‍රදේශයේ දෛනිකව එකතු වන ටොන් 08 ක් පමණ අපද්‍රව්‍ය වෙන් කිරීමකින් තොරව හබරාදුව ලියනගොඩ විහාරස්ථානයට අයත් ඉඩමකට බැහැර කර, පස් දමා වසා දැමීම සිදු කර තිබූ අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු.5,792,430 ක් වැයකර තිබුණි. | දිගුකාලීන සැලසුමක් සකස් කළ යුතුවේ. | දිගුකාලීන සැලසුමක් ක්‍රියාත්මක වෙමින් පවතින බව දන්වමි. |

| | | |
|---|---|---|
| (ii) 2019 වර්ෂයේ දී කසළ කළමනාකරණයට විසඳුමක් වශයෙන් සහා අරමුදලින් රු.5,846,498 ක් වැයකර ජීව වායු ඒකකයක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. 2020 පෙබරවාරි 29 දින වන විට මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට යෝජිතව තිබුණ ද, මෙම ව්‍යාපෘතිය දෙවන අදියරේ ඉදිකිරීම් මට්ටමට පමණක් ළඟා වී තිබුණි. | ඉදිකිරීම් කඩිනම් කළ යුතුවේ. | ඉදිකිරීම් කඩිනම් කරන බව දන්වමි. |

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | දීර්ඝකාලීන සැලසුම් සකස් කර ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවිය යුතුවේ. | බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීමට ඉදිරියේ දී සැලැස්මක් සකස් කරන බව දන්වමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **ආදායම් අයකර නොගැනීම** | | |
| (අ)අහංගම පොදු වෙළඳ සංකීර්ණයේ තිබූ කඩ කාමර 10 ක් ගිවිසුම් ගතවීමෙන් පසු බදු දී තිබුණ ද, 2019 දෙසැම්බර් 31 දින වන විටත් විවෘත කර නොතිබුණි. | ඉදිරියේ දී හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) අහංගම පොදු වෙළඳ සංකීර්ණයේ බදු දී තිබූ කඩ කාමර 77 කින් එක්වන් මුදල් ලෙස රු.17,055,200 ක් හා බදු කුලී ලෙස රු.410,149 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ)හබරාදුව නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 17 කින් 2019 දෙසැම්බර් 31 දින වනවිට අයවිය යුතු බදු කුලිය රු.212,800 ක් විය. | ඉදිරියේ දී හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| (ඇ) ජෝව් ළමා උද්‍යානයේ ආපන ශාලාව 2018 වර්ෂයේ පෙබරවාරි මස සිට වසා දමා තිබුණි. එම ආපන ශාලාවෙන් බදු කුලී රු.158,256 ක් අයවිය යුතුව තිබුණි. මෙම හිඟ මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට හා ආපන ශාලාවේ යතුර නැවත සභාවට ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) සේවක පුරප්පාඩු හා අතිරික්තතා** | | |
| (i) ද්විතීයික හා ප්‍රාථමික තනතුරු 20 ක් පුරප්පාඩුව පවතියි. | අත්‍යවශ්‍ය පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 ට අනුකූල නොවන පරිදි බඳවාගත් ආදේශක සේවකයින් 16 දෙනෙකුට වැටුප් හා දීමනා ගෙවීම සඳහා 2019 වර්ෂයේ දී සභා අරමුදලින් රු.3,276,654 ක් ගෙවා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාර කටයුතු කල යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) කම්කරු සේවකයින් 12 ක් කාර්යාල රාජකාරිවල යොදවා තිබුණි. | විධිමත් පරිදි තනතුරට අනුකූලව වගකීම් පැවරිය යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) වැටුප් රහිත නිවාඩු ලබාගත් සේවකයින් 15 ක් 2019 වර්ෂයේ දී අතිකාල දීමනා වශයෙන් රු.715,521 ක් ලබාගෙන තිබුණි. | විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් ඇති කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්** | | |
| ජෝව් ළමා උද්‍යානය සභාවට පවරා දෙන අවස්ථාවේ දී එහි ළමා පුස්තකාලයේ තිබූ පුස්තකාල පොත් 1269 ක් ඉන්වෙන්ට්‍රි ගතකර නොතිබුණු අතර, පසුගිය වර්ෂවල පැවැත් වූ භාණ්ඩ සමීක්ෂණයන් සඳහා ද මෙම පොත් ඉදිරිපත් කර නොතිබුණි. | නිසි පරිදි භාණ්ඩ සමීක්ෂණය සිදුකළ යුතුවේ. | ඉදිරියේ දී භාණ්ඩ සමීක්ෂණයට ලක් කරන බව දන්වමි. |

**3.5 ප්‍රසම්පාදනය**

**ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | විධිමත් ප්‍රසම්පාදන සැලැස්කමක් සකස් කළ යුතුවේ. | ඉදිරියේ දී ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කරන බව දන්වමි. |

**4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණු අතර, අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපතිට ඉදිරිපත් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණනය ශක්තිමත් කළ යුතුවේ. | අභ්‍යන්තර විගණනයක් සිදුකිරීමට ප්‍රමාණවත් කාර්යමණ්ඩලයක් නොමැත. |

**4.3 විගණන හා කළමනාකරණ කමිටු**

**--------------------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීම සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් සිදු කර නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවිය යුතුවේ. | ඉදිරියේ දී නියමිත පරිදි කමිටු පැවැත්වීමට පියවර ගන්නා බව දන්වමි. |